**සංවර්ධන ලොතරැයි මණ්ඩලය - 2023**

**---------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විට දී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීම ද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇති වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේ දී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේ දී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදු වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදු වන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේ ද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුව ද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේ ද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිත කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම.**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 2 අනුව තොගය, පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයට මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු වුවද 2023 දෙසැම්බර් 31 දින භෞතිකව ගබඩාවේ නොතිබූ පිරිවැය රු.443,609 ක් වූ ශුද්ධ උපලබ්ධි අගයක් නොමැති ක්ෂණික ලොතරැයිපත් 2883 ක තොගයක් ගැණුම් පිරිවැයට අවසන් තොගයේ ඇතුලත් කර තිබීම නිසා රඳවාගත් ඉපයුම් සංචිතය සහ ක්ෂණික ලොතරැයිපත් අවසන් තොගය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | ලොතරැයි ටිකට්පොත් සඳහා ප්‍රායෝගිකව ශුද්ධ උපලබ්ධිත අගයක් නොමැති බැවින් ලොතරැයි ටිකට්පත් මිලට ගැනුම් පිරිවැයට අගය කර ඇත. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අනුව කටයු කිරීම. |
| (ආ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 අනුව දේපල, පිරියත හා උපකරණ අයිතමයකින් ලැබිය හැකි අනාගත ආර්ථික වාසිය අස්ථිත්වය තුලට ගලා එන්නේ නම් හා එහි පිරිවැය විශ්වාසනීය ලෙස මැනිය හැකිනම් පමණක් එය දේපල, පිරියත හා උපකරණ ලෙස හදුනාගත යුතු වුවද ආර්ථික වාසිය අස්ථිත්වය තුලට ගලා ඒම යන කොන්දේසිය සපුරාලිය නොහැකි භෞතිකව මණ්ඩලය සතුව නොමැති වටිනාකම රු.8,095,000 ක් වූ කැබ් රථයක් සහ දැනට භාවිතයෙන් ඉවත් කර ඇති වටිනාකම රු.7,641,159 ක් වූ දිනුම් ඇදීමේ යන්ත්‍ර 07 ක් සමාලෝචිත වර්ෂයේ දේපල, පිරියත හා උපකරණ යටතේ දක්වා තිබුණි. | විගණන විමසුමෙහි සඳහන් රු.8,095,000 ක් වූ ඩබල් කැබ් රථය මණ්ඩලය සතුව භෞතිකව නොමැති යන විගණන නිරීක්ෂණය සමඟ එකඟවේ. මෙම කැබ් රථය සම්බන්ධයෙන් මේවන විට කොළඹ දිසා අධිකරණයේ නඩු පවරා (නඩු අංකය - DMR/4781/2021) ඇති අතර මණ්ඩලය නමින් ලියාපදිංචි කර ඇති බැවින් එය ස්ථාවර වත්කමක් ලෙස ගිණුම්ගත කර ඇත.<br><br>මෙහි සඳහන් රු.7,641,119 වටිනාකම තුල දිණුම් ඇදීමේ යන්ත්‍ර 4 ක් වායු සම්පීඩක 1 ක් සහ දිනුම් ඇදිම සඳහා යොදාගන්නා පන්දු ඇතුලත් වේ. මෙම අයිතම දිනුම් ඇදීමේ කාර්ය සඳහා මණ්ඩලය විසින් ආරම්භක අවධියේ යොදාගන්නා ලද අයිතම වන අතර මේවා මණ්ඩලයේ වත්කම් ලෙස සටහන් තබා ඇත. එම අයිතම දිනුම් ඇදීමේ කාර්ය සඳහා යොදාගන්නා ලද විශේෂ යන්ත්‍ර වන බැවින් මෙම යන්ත්‍ර අපහරණය කිරීමේ දී ගැටළුවක් පවතී. මෙහි ඇති සුවිශේෂිභාවය සහ අබලි තත්වය මත මේවා භාහිර පාර්ශවයන් වෙත අපහරණය කිරීම දුෂ්කර වී ඇත. මේවන විට මෙම යන්ත්‍ර අපහරණය නොකිරීම | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අනුව කටයු කිරීම. |

| | | | |
|---|---|---|---|
| | | මත මෙම යන්ත්‍ර ගිණුම් තුල පෙන්වීම සිදුකර ඇත. | |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දින සිට ජුලි 05 දින දක්වා කාලය තුලදී ශනිදා වාසනා, ලග්න වාසනා, ජයෝදා, කප්රුක, අද කෝටිපති හා වාලම්පුරි යන ලොතරැයිපත් 06 හි විශේෂ දෙවැනි දිනුම් ඇදීම් සඳහා සහ ජුලි 06 දින සිට දෙසැම්බර් 31 දින දක්වා කාලය තුලදී ශනිදා වාසනා, ලග්න වාසනා, ජයෝදා, සුපර් බෝල්, කප්රුක, අද කෝටිපති, සුපිරි ධන සම්පත හා වාලම්පුරි යන ලොතරැයිපත් 08 හි "දෙවන වරම" හා "සෙකන්ඩ් චාන්ස්" දිනුම් ඇදීම් සඳහා ත්‍යාග මුදල් ලෙස ගෙවූ රු.761,885,800 ක මුදල සමාලෝචිත වර්ෂයේ ත්‍යාග වියදමක් ලෙස ගිණුම්ගත නොකර ත්‍යාග සංචිත ගිණුමට ගැලපීම නිසා සමාලෝචිත වර්ෂයේ එම ප්‍රමාණයෙන් ත්‍යාග වියදම අඩුවෙන් හා ලාභය වැඩියෙන් දක්වා තිබුණි. | 2023 ජුලි මස 06 දින සිට ලොතරැයිපතක විකුණුම් මිල ඉහළ දැමීමට සාපේක්ෂව ලොතරැයිපත් කෙරෙහි ඇති පාරිභෝගික ඉල්ලුමේ සිදුවිය හැකි ප්‍රාමාණික පසුබෑම වළක්වා ගැනීමේ අරමුණින් දෙවන වරම හා සෙකන්ඩ් චාන්ස් ලෙස අමතර දිනුම් වාර පාරිභෝගිකයින්ට හඳුන්වාදීමේ උපායමාර්ගික ක්‍රමවේදයක් සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය යටතේ අනුගමනය කර ඇත.<br><br>සංවර්ධන ලොතරැයි මණ්ඩල පනත ප්‍රකාරව ත්‍යාග සංචිත ගිණුම භාවිතා කර අමතර ත්‍යාග ලබා දීම සිදු කර ඇති අතර ත්‍යාග සංචිත ගිණුමේ එකතු වී තිබූ මුදල් ප්‍රමාණය මීට පෙර අවස්ථා වල දී ආදායම් ප්‍රකාශය තුළින් ගැලපීම් සිදු කර ඇති බැවින් නැවත වරක් වියදමක් ලෙස දැක්විය යුතු නොවන බව දැනුම් දෙමි. | "දෙවන වරම" හා "සෙකන්ඩ් චාන්ස්" යන දිනුම් අවස්ථා සඳහා සංචිත ගිණුමේ ප්‍රතිපාදන භාවිතා නොකර වර්ෂයේ ත්‍යාග වියදම් ගිණුම හරහා අදාළ වියදම් දැරීම සිදුකල යුතුය. |
| (ආ) | සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ තොග ගණනය කිරීමේ ක්‍රමවේදය අනුව ඉදිරි වර්ෂයේ දිනුම් ඇදීම් සඳහා මුද්‍රණය කර දෙසැම්බර් 31 දිනට ගබඩාවට භාරදී ඇති ලොතරැයිපත් වල වටිනාකම අවසාන තොග සමීක්ෂණයේදී අවසන් තොගය ලෙස හඳුනාගනු ලැබුවද 2024 ජනවාරි 01 දින සිට ජනවාරි 27 දින දක්වා කාලපරිච්ඡේදයේ දිනුම් ඇදීම් සඳහා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින ගබඩාවට භාරදී තිබූ ලොතරැයි පත් 4,605,000 ක වටිනාකම වූ රු.5,787,310 ක් අවසන් තොගයට ඇතුලත් කර නොතිබීම නිසා අවසන් තොගය සහ වෙළඳ ණය හිමියන් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | විගණන විමසුමේ සඳහන් ටිකට්පොත් 460,500 ක ප්‍රමාණය 2023 දෙසැම්බර් 31 දිනට ගබඩාවට ලැබී තිබුණ ද එම ටිකට්පොත් තොග නියමිත පිරිවිතරයන්ට අනුකූලවන බවට සහතික කර GRN නිකුත් කර නොමැති බැවින් එම ටිකට්පොත් තොගය 2023 දෙසැම්බර් 31 දිනට ගිණුම් ගතකර නොමැත. | මෙම ටිකට්පත් තොගය 2023 දෙසැම්බර් 31 දින වන විට ගබඩාවට ලැබී ඇති බැවින් අතැති තොගයක් ලෙස සැලකිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ සේවකයන් විශ්‍රාම යාමේදී හෝ සේවයෙන් ඉවත්වීමේදී ගෙවිය යුතු පාරිතෝෂිත ගෙවීම සඳහා රාජ්‍ය බැංකු දෙකක ආයෝජනය කර තිබූ ස්ථාවර තැන්පතු 06 ක් සඳහා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු රු.6,619,629 ක පොලී ආදායම ශුද්ධ සේවක ප්‍රතිලාභ වගකීම ගණනය කිරීමේදී සැලකිල්ලට නොගෙන ජංගම වත්කම් යටතේ වූ ස්ථාවර තැන්පතු වටිනාකමට එකතුකර තිබීම නිසා සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනයේ ස්ථාවර තැන්පතු ශේෂය සහ සේවක ප්‍රතිලාභ වගකීම් ශේෂය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | රු.6,619,629 ක පොලී ආදායම ලැබිය යුතු පොලී ආදායමක් වන අතර මණ්ඩලය විසින් පොලී ආදායම නැවත ස්ථාවර තැන්පතුවට එකතු කර ආයෝජනය කරනු නොලබන බැවින් ශුද්ධ සේවක ප්‍රතිලාභ වගකීම ගණනය කිරීමේදී සැලකිල්ලට නොගෙන ජංගම වත්කම් යටතේ වූ ස්ථාවර තැන්පතු වටිනාකමට එකතු කර ඇත. | මෙම ස්ථාවර තැන්පතු 06 ඇති කර ඇත්තේ ඉවත්ව යන සේවකයන්ට පාරිතෝෂික ගෙවීම සඳහා බැවින් ලැබිය යුතු පොලී ආදායම ශුද්ධ සේවක ප්‍රතිලාභ වගකීම ගණනය කිරීමේදී සැලකිල්ලට ගත යුතුය. |
| (ඈ) | ස.තො.ස ආයතනයෙන් 2009 වර්ෂයේ නිකුත් කර තිබූ වටිනාකම රු.592,500 ක් වූ ත්‍යාග වවුචර් පත් 123 ක් මූල්‍ය තත්ව ප්‍රකාශනයේ ත්‍යාග භාණ්ඩ අවසන් තොගය ලෙස ඇතුලත් කර තිබුණද මෙම වවුචර් පත් ලොතරැයි මණ්ඩලයට ලැබී සමාලෝචිත වර්ෂය අවසන් වන විට වර්ෂ 14 කට අධික කාලයක් ගතවී ඇති බැවින් සහ ඒ සඳහා මුදල් ලබාගැනීම සම්බන්ධව අවිනිශ්චිත තාවයක් තිබියදී ඒ සඳහා අවශ්‍ය ගැලපීම් සිදු නොකර මූල්‍ය තත්ව ප්‍රකාශනයේ ජංගම වත්කමක් ලෙස සටහන් කර තිබුණි. | ස.තො.ස ආයතනය විසින් මෙම වවුචර්පත් නැවත සක්‍රිය කර දීමට නොහැකි බව ලිපියක් මඟින් දන්වා ඇති බැවින් එම වවුචර්පත් ශේෂය තවදුරටත් ගිණුම් තුල පවත්වාගෙන යෑම නිශ්ඵල කරුණක් බව අනාවරණය වන නිසා ගිණුම් වලින් ඉවත් කිරීම සම්බන්ධයෙන් විගණන හා කළමණාකරණ කමිටුවේ උපදෙස් මත 2024 මැයි මස 20 දින පැවති සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කර ඇති අතර එම මුදල ගිණුම් වලින් ඉවත් කිරීම සඳහා අනුමැතිය හිමි වී ඇත. | මෙම ත්‍යාග වවුචර්පත් වලට මුදල් ලබාගැනීම හෝ ඒවා නැවත සක්‍රීය කිරීම කල නොහැකි බව පෙනී යන බැවින් මෙම ශේෂය සම්බන්ධයෙන් සුදුසු තීරණයක් ගත යුතුය. |
| (ඉ) | සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ කෑම කාමරය , ගබඩා කාමරය සහ මායිම් බිත්ති අලුත්වැඩියා කිරීම සඳහා 2017 සහ 2018 වර්ෂවලදී දරන ලද රු.1,728,884 ක වියදම සිදුකර සමාලෝචිත වර්ෂය අවසන් වන විට වසර 06 කට අධික කාලයක් ගතවී තිබුණද අවශ්‍ය ගිණුම්කරණ ගැලපීම් සිදුනොකර දේපල පිරියත උපකරණ යටතේ කෙරීගෙන යන වැඩ ලෙස දක්වා තිබුණි. | වත්කමක් ලෙස හඳුනාගැනීම සඳහා අදාල වත්කම ප්‍රතිලාභ ලැබෙන මට්ටමට නිමවී තිබිය යුතුය. එබැවින් 2023 දෙසැම්බර් 31 දින වන විටත් මෙම ඉදිකිරීම් නිම වී නොතිබූ හෙයින් විගණන විමසුමෙහි සඳහන් අයිතම ප්‍රාග්ධනිත කර ක්ෂය කිරීමට කටයුතු යොදා නොතිබුණි. | කෑම කාමරය හා ගබඩා කාමරය දැනටමත් භාවිතායට ගන්නා බැවින් අවශ්‍ය ගිණුම්කරණ ගැලපීම් සිදුකල යුතුය. |

### 1.5.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| | විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු. | අනුරූපී වාර්තා අනුව වටිනාකම රු. | වෙනස රු. | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|---|
| **(අ)** | **සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ශේෂ** | | | | ගුවන් විදුලි සංස්ථාව සහ එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විගණනයට සෘජුව තහවුරු කරන ලද ශේෂ සම්බන්ධව විස්තර ලබා දෙන ලෙස ඉල්ලා සිටින අතර අදාල සැසඳුම් සිදුකර වෙනස පැහැදිලි කිරීමට කටයුතු කරනු ලැබේ. | අදාළ ආයතන සමඟ සාකච්ඡා කර එම ශේෂ සැසඳීම් කළ යුතුය. |
| | - ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව | 11,884,975 | 22,606,401 | 10,721,426 | | |
| | - සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම | 4,735,627 | 2,754,832 | 1,980,795 | | |
| **(ආ)** | **සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ස්ථාවර වත්කම් ශේෂයන්** | | | | විගණන විමසුමෙහි සඳහන් මෙම වෙනස 2024 වර්ෂයේ ගිණුම් තුල නිවැරදි කර ඇත. | උපලේඛන සමඟ මූල්‍ය ප්‍රකාශනවල ඇති වත්කම් ශේෂ සැසඳීම් කළ යුතුය. |
| | - කාර්යාල උපකරණ හා ජංගම දුරකථන ශේෂය | 43,416,368 | 43,353,012 | 63,356 | | |
| | - ලිබඩු හා සවිකිරීම් ශේෂය | 14,802,820 | 14,881,156 | 78,336 | | |
| | - පරිගණක උපාංග | 57,425,324 | 57,175,052 | 250,272 | | |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මණ්ඩලය විසින් වොක්ෂෝල් වීදියේ අංක 234 දරන ගොඩනැගිල්ල 2006 ඔක්තෝබර් මාසයේ සිට කුලී පදනම මත ලබාගැනීම සඳහා එළඹුණු ගිවිසුම ඒකපාර්ශිකව කඩ කර තිබීම නිසා තැන්පතු මුදල ලෙස ගෙවූ රු.723,780 ක් හා එම වර්ෂයන් සඳහා ගෙවූ කුලී මුදලින් කොටසක් වන රු.4,976,220 ක් | වොක්ෂෝල් වීදියේ අංක 234 දරණ ගොඩනැගිල්ල කුලියට ගැනීමට අදාලව මණ්ඩලයට ලැබිය යුතු රු.5,700,000 ක මුදල අය කර ගැනීම සම්බන්ධව මුදල් අමාත්‍යාංශයේ කමිටුවක් පත් කර වාර්තාවක් ලබා ගත් අතර එම වාර්තාවේ සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා | ලැබිය යුතු මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| යන මුදල්වල එකතුව වන රු.5,700,000 ක් දැනට වර්ෂ 17 ක් මුළුල්ලේ අයකර ගැනීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණි. | අවශ්‍ය ඉදිරි නීතිමය කටයුතු නීතිපති දෙපාර්තමේන්තුව විසින් සිදු කරගෙන යනු ලබයි. ඊට අදාල සියලු තොරතුරු මේ වන විට නීතිපති දෙපාර්තමේන්තුව වෙත ලබා දී ඇත. නමුත් මේ සම්බන්ධව ගෙන ඇති ක්‍රියාමාර්ග වල ප්‍රගතිය නීතිපති දෙපාර්තමේන්තුවෙන් නොලැබුණු බැවින් 2023 ජූලි 24 දිනැතිව නැවත ලිපියක් යොමු කරමින් නීතිපති දෙපාර්තමේන්තුවෙන් මේ සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳව විමසීමක් සිදු කර ලදී. | |
| (ආ) 1990 වර්ෂයේ වෝඩ් පෙදෙසේ පුද්ගලයෙකු සමඟ ඇතිකරගෙන තිබූ කුලී ගිවිසුම ප්‍රකාරව රු.2,520,000 ක ගොඩනැගිලි කුලී තැන්පතු මුදලක් අයකර දෙන ලෙස ඉල්ලා අවුරුදු 24 කට පෙර ගොනුකර තිබූ නඩුවේ තීන්දුව 2016 ජනවාරි 11 දින ලැබී තිබුණි. අදාල මුදල අයකර ගන්නා ලෙස නඩු තීන්දුව ප්‍රකාශ වී වර්ෂ 07 කට ආසන්න කාලයක් ගත වී තිබුණත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම මුදල අයකර ගැනීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණි. | මෙම මුදල අය කර ගැනීම සඳහා වන අධිකරණ ක්‍රියාමාර්ගයේ අවසන් අදියරයේ පවතින බව රජයේ නීතිඥවරිය විසින් ලිඛිතව 2023 ඔක්තෝබර් 25 වන දින අප වෙත දන්වා ඇත. | මෙම මුදල කඩිනමි අයකර ගැනීම කටයුතු කළ යුතුය |

**1.6.2 ගෙවිය යුතු මුදල්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 දෙසැම්බර් 31 දිනට වෙළඳ ණයහිමි ගිණුමේ රු.414,095,595 ක ශේෂයක් පැවති අතර එය තුල වසර 1 ත් 2 ත් අතර කාලයක් තුල පවතින රු.207,860 ක ශේෂයක්ද, වසර 3 ඉක්මවූ රු.2,800,000 ක ශේෂයක්ද විය. සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම ණය ශේෂයන් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම ශේෂයන් ඉදිරියේ දී ගෙවීමට නියමිත බැවින් 2023 වර්ෂයේ අවසාන ගිණුම්වල වෙළඳ ණයහිමි ගිණුමේ ශේෂය තුළ ඇතුළත් කර ඇති අතර ගෙවීම් නිරවුල් කිරීමට කටයුතු කරනු ලැබේ.<br><br>වසර 3 ඉක්මවූ රු.2,800,000 ක ශේෂය වන්නේ සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ කාර්ය පරිපාටිය සකස් කිරීම සම්බන්ධව ගෙවිය යුතු මුදල වේ. මෙම කාර්යයේ අවශ්‍ය සංශෝධන අවසන් කර නොමැති බැවින් මේ දක්වා ගෙවීම් අත්හිටුවා ඇත. | ගෙවිය යුතු මුදල්වල නීත්‍යානුකූලභාවය නැවත පරීක්ෂා කිරීමට කටයුතු කළ යුතුය. |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම.**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 1997 අංක 20 දරන සංවර්ධන ලොතරැයි මණ්ඩල පනත | | | |
| i. 17 (5) වගන්තිය | ත්‍යාගලාභීන් හිමිකම් නොපෑ, මාස 06 ක කාලසීමාව ඉකුත් වූ ත්‍යාග සඳහා මිලදීගත් භාණ්ඩ විකිණීමෙන් ලැබෙන මුදල පළමු කොට අරමුදලටද, ඉන් පසුව ජනාධිපති අරමුදලටද බැරකල යුතු වුවත්, 2018 සහ 2020 වර්ෂයේදී ත්‍යාග වශයෙන් ලබාදීමට මිලදී ගත් එකතු වටිනාකම රු.779,750 ක්වූ යතුරු පැදි තුනක් අලෙවි කර එම පනත ප්‍රකාරව යෙදවීමට 2022 වර්ෂයේ මැයි 31 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබාදී තිබුණද, අදාල කටයුතු වර්තමානය වන විටත් සිදුකර නොතිබුණි. | 2018 හා 2020 යන වර්ෂ වල සුපර්බෝල් සහ කෝටිපති ශනිදා ලොතරැයිපත් වල දිනුම් ඇදීමේ ත්‍යාග වශයෙන් මිලදී ගත් යතුරු පැදි 03 අපහරණය කර එම මුදල් ජනාධිපති අරමුදලට යොමු කිරීමට 2022 මැයි 31 වන දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී අනුමැතිය හිමි විය.<br><br>ඒ අනුව මෙම යතුරුපැදි 03 විධිමත් පරිදි නැවත තක්සේරු කිරීම සඳහා කමිටුවක් පත් කර ඇති අතර තක්සේරු කිරීමෙන් අනතුරුව ඉදිරි මාස 02ක කාලය තුළ විධිමත් අපහරණ ක්‍රියාවලියකට භාජනය කර එම අරමුදල් ජනාධිපති අරමුදලට යොමු කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ඇත. | සංවර්ධන ලොතරැයි මණ්ඩල පනත අනුව කටයුතු කළ යුතුය. |
| ii. 19 (1) හා 19 (2) වගන්ති | නියමිත යැයි මේ පනතින් ප්‍රකාශිත හෝ බලය දී ඇති සියලු කාරණා සම්බන්ධයෙන් මණ්ඩලය විසින් රීති සෑදිය යුතු වුවද එසේ කටයුතු කර නොතිබුණි. | දැනට කෙටුම්පත් කරන ලද රීතීන් ඇතුලත් ලේඛණය අධ්‍යක්ෂ මණ්ඩලයට යොමු කර ඇති අතර එහි පරිගණක පද්ධතියට අදාල රීතීන්, කොළඹ විශ්ව විද්‍යාලයේ පරිගණක අංශය මගින් තහවුරු කර ඇති අතර තවදුරටත් මණ්ඩලයේ අංශ අතර කටයුතු පිළිබඳ ඇතුලත් විය යුතු කරුණු ඇතුලත් කර සංශෝධනය කරන ලද කෙටුම්පත ඉදිරියේදී අධ්‍යක්ෂ මණ්ඩලයට යොමු කිරීමට යෝජිතය. | සංවර්ධන ලොතරැයි මණ්ඩල පනත අනුව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 2019 දෙසැම්බර් 17 දිනැති අංක 08/2019 දරන රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තු චක්‍රලේඛය | 2020 ජනවාරි 31 දිනට පෙර රාජ්‍ය සංස්ථා ඇතුළු රාජ්‍ය ආයතන www.promise.lk වෙබ් අඩවිය යටතේ හඳුන්වා දී ඇති විද්‍යුත් රාජ්‍ය ප්‍රසම්පාදන ක්‍රමවේදය (e–GP) යටතේ ලියාපදිංචි විය යුතු වුවත්, සංවර්ධන ලොතරැයි මණ්ඩලය මෙම ක්‍රමවේදය යටතේ ලියාපදිංචි වී නොතිබුණු බැවින්, ඒ අනුව ප්‍රසම්පාදන කටයුතු සිදු කර නොතිබුණි. | E-GP සඳහා මණ්ඩලය ලියාපදිංචි වී ඇති අතර, ඊට අදාල පුහුණු වැඩසටහන් සඳහා නිලධාරීන් සහභාගී කරවා ඇත. එහිදී ලබා දුන් උපදෙස් හා එම පද්ධතියේ මූලික පුහුණු ආදර්ශ ඉටු කිරීම ආරම්භ කර ඇත. | අදාළ චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | ශ්‍රීලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය | | | |
| | i. 4.2.3 වගන්තිය සඳහා වූ 31 වැනි අතිරේකය | රු.මිලියන 1,328 ක ඇස්තමේන්තු වටිනාකමකට 2023 වර්ෂය සඳහා ලොතරැයි වර්ග 08 ක මුද්‍රණ කටයුතු සිදු කිරීම හා සැපයීම සඳහා මුද්‍රණකරුවන් තෝරාගැනීමේ ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර සති 10 ක් තුල නිම කල යුතු වුවද ඒ සඳහා සති 65 ක කාලයක් ගත කර තිබුණි. | ප්‍රසම්පාදන ඇගයීම් ක්‍රියාවලියේදී අවස්ථානුකූලව මතුවන කරුණු හා සම්බන්ධව සලකා බැලීමේදී ඇස්තමේන්තුගත කාලයට අතිරේක කාලයක් ගතවී ඇත. ප්‍රසම්පාදනය සති 10 ක් තුල සිදුකල යුතු බවට මාර්ගෝපදේශ ගතව ඇතත්, ප්‍රසම්පාදනයේ ස්වභාවය මත ඊට අදාල ප්‍රසම්පාදන කාලසටහන පිළියෙල කිරීමට ප්‍රතිපාදන ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන මත කටයුතු කළ යුතුය. |
| | ii. 2.9.2 වගන්තිය සඳහා වූ 32 වන අතිරේකය | ප්‍රසම්පාදන හා තාක්ෂණික ඇගයීම් කමිටු සාමාජිකයන්ට ගෙවීම් කිරීමේදී සම්පූර්ණ දීමනාව ලබාගැනීමට නම් සති 10 ක කාලය තුල ප්‍රසම්පාදන කාර්යයන් අවසන් කල යුතු වුවද 2023 වර්ෂය සඳහා ලොතරැයි මුද්‍රණය කිරීමේ සැපයුම්කරුවන් තෝරාගැනීමේ ප්‍රසම්පාදන කාර්යය සඳහා සති 65 ක කාලයක් ගත කර තිබියදී අදාළ කමිටු සාමාජිකයන්ට මුළු දීමනාව වශයෙන් රු.345,000 ක් ගෙවා තිබුණි. | ප්‍රසම්පාදන කමිටු සඳහා ගෙවීම් කිරීමේදී අනුමත ප්‍රසම්පාදන කාල සටහනට අනුකූලව ප්‍රසම්පාදන කාර්යය ඉටු කර තිබේද යන්න සැලකිල්ලට ගෙන එම ගෙවීම් සිදු කරනු ලබයි. ඒ අනුව එකී අනුමත ප්‍රසම්පාදන කාලසටහනට අනුකූලව තාක්ෂණික ඇගයීම් කමිටුව හා ප්‍රසම්පාදන කමිටුව එකී කටයුතු ඉටු කිරීම මත එම දීමනා ගෙවීම් සිදුකර ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන මත කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | iii.4.2.1 වගන්තිය | සමාලෝචිත වර්ෂය සඳහා සවිස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි. | එක් එක් ප්‍රසම්පාදන අයිතමයට අදාල අදියරයන් නිරන්තරයෙන් සංශෝධනය වන බැවින් සවිස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝප දේශ සංග්‍රහයේ විධිවිධාන මත කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2022 ජනවාරි 18 දිනැති අංක 02/2022 (i) දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛය | (i) දුරකථන වියදම් සීමාව නොසලකා සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ නිලධාරීන් 11දෙනෙකු සඳහා 2022 ජනවාරි සිට 2023පෙබරවාරි දක්වා කාලපරිච්ඡේදයේ දුරකථන වියදම් දීමනාව ලෙස එකතුව රු.141,599 ක් වැඩියෙන් ගෙවා තිබුණි. | දුරකථන වියදම් සීමාව අභිබවා ලබා ගත් රු.141,599 දුරකථන ගාස්තුව අදාල කාර්ය මණ්ඩල සාමාජිකයින්ගෙන් මාසික වැටුපෙන් අඩු කර ගැනීමට කටයුතු කර ඇත. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| | | (ii) දුරකථන වියදම් දීමනාව සඳහා හිමිකම් නොලබන නිලධාරීන් 53 කට එකතුව රු.1,200,064 ක් දුරකථන වියදම් දීමනාව ලෙස සමාලෝචිත වර්ෂය තුලදී ගෙවා තිබූ අතර ඒ සඳහා 2023පෙබරවාරි 23 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල තීරණය පරිදි රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. | මේ සම්බන්ධව 2024 මාර්තු 07 දිනැතිව රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවෙන් ලද ලිපිය ප්‍රකාරව දුරකථන දීමනාව ලබා දීම සඳහා හා දුරකථන ලබාදීමේ ක්‍රමවේදය සම්බන්ධව නව ක්‍රමවේදයක් සකස් කර ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන කටයුතු කරන ලෙස උපදෙස් ලබා දී තිබුණි. ඒ අනුව මේ සම්බන්ධව විධිමත් ක්‍රමවේදයක් සකස් කර 2024 මැයි 20 වන දින පැවති 294 අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කල අතර ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය හිමි විය. ඒ අනුව මින් ඉදිරියට රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවෙන් ලබා දී ඇති උපදෙස් ප්‍රකාරව සකස් කර ක්‍රමවේදය අනුව ක්‍රියා කරනු ලැබේ. | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්ත මේන්තුවේ අනුමැතිය ලබා ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඉ) | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ 2015 මැයි 25 දිනැති අංක PED/1/2015 දරන චක්‍රලේඛයේ 2.3 ඡේදය | නිල වාහන හිමිකම් නොමැති නිලධාරීන් පස් දෙනෙකු සඳහා නිල වාහන සපයා දී තිබූ අතර ඒ වෙනුවෙන් ඉන්ධන වියදම් ලෙස සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.2,913,410 ක වියදමක් දරා තිබුණි. | 2023 ජූලි 09 දිනැතිව රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් යොමු කර ඇති ලිපිය ප්‍රකාරව කටයුතු කිරීම සඳහා ජාතික ලොතරැයි මණ්ඩලය අනුගමනය කරන ක්‍රමවේදයට සමාන ක්‍රමවේදයක් සංවර්ධන ලොතරැයි මණ්ඩලයද අනුගමනය කරමින් සහකාර සාමාන්‍යාධිකාරිවරුන්ට ප්‍රවාහන පහසුකම් ලබා දීමට අවශ්‍ය වන අනුමැතිය ලබා ගැනීම සඳහා 2024 මැයි මාසයේ 20 වන දින පැවැත්වෙන 294 අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් යොමු කරන ලදී. ඒ අනුව රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් ලබා දී ඇති උපදෙස් අනුව සකස් කල අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව සඳහා අනුමැතිය හිමි වූ අතර එම නව ක්‍රමවේදය 2024 ජූනි මස සිට ක්‍රියාත්මක කරනු ඇත. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඊ) | 2016 මැයි 30 දිනැති අංක 04/2016 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛය | නිල වාහන හිමිකමක් නොමැති නිලධාරිනියකට මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ මණ්ඩලය විසින් ලබාගත් මෝටර් රථයක් ලබාදී තිබූ අතර එම මෝටර් රථය සඳහා සමාලෝචිත වර්ෂයේදී මෙහෙයුම් කල්බදු කුලී ලෙස රු.2,028,000 ක් ගෙවා තිබුණි. | මණ්ඩලයේ මෝටර් රථවල පවතින හිඟතාවය හේතුවෙන් මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ මෝටර් රථ 03 ක් ලබාගෙන ඇත. එම මෝටර් රථ අතුරින් මෝටර් රථ 02ක් සාමාන්‍යාධිකාරි හා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරයෙකුට අනුයුක්ත කර ඇති අතර අනෙක් මෝටර් රථය සහකාර සාමාන්‍යාධිකාරිවරයෙකුට අනුයුක්ත කර ඇත. මණ්ඩලයේ සංචිතයේ පැවති මෝටර් රථයක් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරයෙකු සඳහා අනුයුක්ත කර ඇත. ඉදිරියේදී මෙම නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරයා වෙත මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ ලබාගත් වාහනය අනුයුක්ත කිරීමට කටයුතු කරනු ලැබේ. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.3,622,506,725 ක බදු පසු ලාභයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ බදු පසු ලාභය රු.3,210,687,041 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.411,819,684 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට ලොතරැයිපත් විකුණුම් ආදායම රු.19,071,456,751 සිට රු.25,442,131,713 ක් දක්වා සියයට 33 කින් වර්ධනය වීම ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී ලොතරැයිපත් විකුණුම් ආදායම රු.6,370,674,962 කින් හෙවත් සියයට 33 කින් වැඩිවී තිබුණි. සමාලෝචිත වර්ෂයේදී ජූලි මස සිට ලොතරැයි පතක මිල රු.20 සිට රු.40 දක්වා ඉහළ දැමීම මෙයට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

### 2.3 අනුපාත විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂයේ මණ්ඩලයේ මෙහෙයුම්, ලාභදායීත්වය හා ද්‍රවශීලතාවය දැක්වෙන අනුපාත පිළිබඳ විග්‍රහයක් පහත දැක්වේ.

| | වර්ෂය | |
|---|---|---|
| | **2023** | **2022** |
| <u>ලාභදායීත්ව අනුපාත</u> | | |
| දළ ලාභ අනුපාතය (සියයට) | 39 | 40 |
| ශුද්ධ ලාභ අනුපාතය (සියයට) | 14 | 17 |
| <u>ද්‍රවශීලතා අනුපාතය</u> | | |
| ජංගම අනුපාතය (වාර ගණනක්) | 1:1.18 | 1:1.32 |
| ක්ෂණික අනුපාතය (වාර ගණනක්) | 1:1.16 | 1:1.3 |
| <u>මෙහෙයුම් අනුපාත</u> | | |
| විකුණුම් ආදායමට විකුණුම් පිරිවැය (සියයට) | 60 | 60 |
| මුළු ආදායමට මුළු බෙදාහැරීමේ හා පරිපාලන වියදම් (සියයට) | 29 | 27 |

මණ්ඩලයේ ප්‍රවර්ථන වර්ෂයේ දළ ලාභ හා ශුද්ධ ලාභ අනුපාතයන් පිළිවෙලින් සියයට 39 හා සියයට 14 ක් වූ අතර, ඉකුත් වර්ෂයේ එම අනුපාතයන් පිළිවෙලින් සියයට 40 හා සියයට 17 ක් විය. ඒ අනුව ප්‍රවර්ථන වර්ෂයේදී දළ ලාභ හා ශුද්ධ ලාභ අනුපාතයන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව පිළිවෙලින් සියයට 01 කින් හා සියයට 03 කින් අඩුවී ඇත. ඒ අනුව මණ්ඩලයේ මෙහෙයුම් කටයුතුවල කාර්ය සාධනය අඩුවී ඇති බවට නිරීක්ෂණය වේ.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් දිස්ත්‍රික් බෙදාහැරීමේ අලෙවි නියෝජිතයින් වෙත නිකුත් කරන ලද 2011 ජූනි 26 දිනැති අංක | මේ සම්බන්ධයෙන් දිස්ත්‍රික් බෙදාහැරීමේ අලෙවි නියෝජිතයින් වෙත චක්‍රලේඛ නිකුත් කර ඇත. ඉතිරි වූ ලොතරැයිපත් දින 14 ක් ඇතුළත මණ්ඩලයට භාර දිය යුතුය. එසේ | සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ අභ්‍යන්තර |

| | | | |
|---|---|---|---|
| | ඩී.එල්.බී/එෆ්අයිඑන්/සීඅයිආර්/2011/11 දරන ලිපිය ප්‍රකාරව මණ්ඩලයෙන් ලබාගෙන අලෙවි කිරීමට නොහැකිව ඉතිරි වූ ලොතරැයිපත්, දිනුම් ඇදීමෙන් අනතුරුව දින 14 ක් තුලදී ප්‍රධාන කාර්යාලයට භාරදිය යුතු වුවද බෙදාහැරීමේ අලෙවි නියෝජිතයින් විසින් සමාලෝචිත වර්ෂය තුලදී අලෙවි කිරීමට නොහැකිව ඉතිරි වූ ලොතරැයිපත් 77,406 ක් දිනුම් ඇදීමෙන් පසු මණ්ඩලයට භාරදී නොතිබුණි. | සිදු නොවන අවස්ථා වලදී බෙදාහැරීමේ අලෙවි නියෝජිතයින් විසින් එම ලොතරැයිපත් අලෙවි කළා සේ ලෙස සලකා එහි විකුණුම් වටිනාකම හා එම දිනුම් ඇදීමට අදාල ඔහුගේ කොමිස් මුදල දණ්ඩනයක් ලෙස මණ්ඩලය අය කර ගනු ලබයි. මේ වන විට මෙම ගැටළුව බොහෝ දුරට නිරාකරණය වී ඇත. | කළමනාකරණ ලිපිය අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | බෙදාහැරීමේ අලෙවි නියෝජිතයින් වෙත නිකුත් කරන ලොතරැයි වලින් ආපසු එවුම් සඳහා ඉඩදී ඇති ප්‍රතිශතය 2023 පෙබරවාරි සිට සියයට 05 සිට සියයට 10 ක් දක්වා වැඩි කිරීමට කළමනාකාරීත්වය අනුමැතිය ලබාදී තිබුණි. සමාලෝචිත වර්ෂයේදී වාලම්පුරි, ලකී ඩ්‍රීම් සහ සුපිරි ධන සම්පත යන ලොතරැයි වර්ග 03 න් ආපසු එවූ ලොතරැයිපත් ප්‍රමාණය 5,163,662 ක් වූ අතර එය විකිණීමට නිකුත් කරන ලොතරැයිපත් වලින් පිළිවෙලින් සියයට 28, 17 හා 21 ක් විය. එම නොවිකිණි ආපසු එවන ලද ලොතරැයි පත් ප්‍රමාණයේ එකතු මුද්‍රණ පිරිවැය රු.14,701,781 ක් විය. | 2023 නොවැම්බර් මස 09 දින සුපිරි ධන සම්පත ලොතරැයි ටිකට්පත ආරම්භ කල අතර ආරම්භක කාල සීමාව තුල මණ්ඩලය බලාපොරොත්තු වූ අලෙවියට වඩා වැඩි මට්ටමකින් ටිකට්පතේ දෛනික අලෙවියක් සිදු විය. ඒ අනුව සුපිරි ධන සම්පත ලොතරැයි ටිකට්පත සඳහා ද ආරම්භක අදියරේදී ප්‍රමාණවත් ටිකට්පත් තොග වෙළඳපොලට ඉදිරිපත් කරන ලද අතර මණ්ඩලය බලාපොරොත්තු වූ මට්ටමේ දෛනික අලෙවියක් ද සිදු කරන ලදී. තරගකාරී ආයතනය විසින් මෙම ටිකට්පත වෙළඳපොළ තුල ස්ථාවර වන බව නිරීක්ෂණය කර තහවුරු කිරීමෙන් පසුව මීට සමාන වන පරිදි ටිකට්පතක් ඔවුන් විසින් වෙළඳපොළට ඉදිරිපත් කිරීමක් සිදුකරන ලදී. එම නිසා ටිකට්පතේ දෛනික අලෙවිය අඩුවීමක් සිදු විය. ඒ හේතුවෙන් ආපසු එවුම් ප්‍රමාණය වැඩි වීමක් සිදු වූ අතර වර්තමානය වන විට ඉල්ලුමට සරිලන සැපයුමක් පමණක් සිදු කරන බැවින් විශාල ආපසු එවුම් ප්‍රමාණයක් ඇති නොවන පරිදි ක්‍රියා කර ඇත. | අලෙවි නියෝජිතයින්ට නිකුත් කරන ලද ලොතරැයිවල ආපසු එවුම් සඳහා ඉඩදී ඇති ප්‍රතිශතය තුළ කටයුතු කළ යුතුය. |
| (ඇ) | 1997 අංක 20 දරන සංවර්ධන ලොතරැයි මණ්ඩල පනතේ 17 (5) වගන්තිය අනුව සංවර්ධන ලොතරැයියක ත්‍යාගලාභීන් නිශ්චය කරනු ලැබූ දින සිට ගණන් බලනු ලැබූ මාස 06 කාලසීමාවක් ඉකුත්වීමෙන් පසුව ,ඒ ලොතරැයියේ ඒ ත්‍යාගයට හිමිකම් ලබනු තැනැත්තා සොයා ගැනීමට නොහැකි වීමේ හේතුවෙන් ඒ ලොතරැයියේ ප්‍රදානය කර නොමැති යම් ත්‍යාගයක් , රජය සන්තක විය යුතු අතර ඉන්පසු එය ජනාධිපති අරමුදලට බැර කල යුතු වුවද | මෙවැනි ආකාරයේ ඉදිරියේදී ගෙවීම් සිදු කිරීමට අවශ්‍යය වුවහොත් සභාපති/ අධ්‍යක්ෂ මණ්ඩල විශේෂ අනුමැතියකින් තොරව සිදු කිරීමට නොහැකි වන සේ අභ්‍යන්තර පාලන ක්‍රමවේද ශක්තිමත් කර ඇත. | දිනුම් අදින ලද දිනයේ සිට මාස 6 ඉක්මවූ ලොතරැයිපත් සඳහා ත්‍යාග මුදල් නොගෙවීමට හැකි වනසේ අභ්‍යන්තර පාලන ක්‍රමය ශක්තිමත් කළ යුතු වීම සහ |

| | | | |
|---|---|---|---|
| | සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ සහකාර සාමාන්‍යාධිකාරීවරයකුට අයත් මාස 06ක කාලසීමාව ඉකුත්වූ වර්ග 05 ක ලොතරැයිපත් 27කට හිමි එකතුව රු 11,000.ක් වූ ත්‍යාග මුදල් ගෙවා තිබුණි .තවද මණ්ඩලයේ ලොතරැයි කළමනාකරණ පද්ධතියට දිනුම් අදින ලද දින සිට මාස 06ක වලංගු කාලය ඉක්මවූ ලොතරැයි පරිලෝකණය කිරීමේදී අවලංගුවූ ලොතරැයියක් ලෙස ප්‍රතික්ෂේප කරනු ලැබුවද මෙම ලොතරැයිපත් 27සඳහා ගෙවීම් කිරීමට හැකිවන ලෙස පරිගණක පද්ධතියද වෙනස්කිරීමට කටයුතු කර තිබුණි. | | සංවර්ධන ලොතරැයි මණ්ඩල පනත අනුව කටයුතු කිරීම. |
| (ඇ) | සංවර්ධන ලොතරැයි මණ්ඩලය තුල ලොතරැයි මෙහෙයුම් හා කළමනාකරණ ක්‍රියාවලිය බාහිර සේවා සැපයුම් ආයතනයක් තුලින් සිදුවන බැවින් ලොතරැයි කළමනාකරණ මෘදුකාංග පද්ධතියක් නිර්මාණය කිරීම හා ස්ථාපනය කිරීම, කාර්ය මණ්ඩලය පුහුණු කිරීම සඳහා සුදුසු සැපයුම්කරුවකු තෝරාගැනීම සඳහා අවශ්‍ය ලංසු ලියවිලි පිළියෙල කිරීමේ කටයුතු 2020 ජූලි මස ආරම්භ කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ අවසානය වන විටත් එම කටයුතු අවසන්වී නොතිබුණි. මේ නිසා 2020 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා මාසික සේවා ගාස්තු සියයට 68 ක වැඩිවීම් සහිතව සේවා ගිවිසුම් කාලය දීර්ඝ කරමින් තරඟකාරී ටෙන්ඩර් පරිපාටියෙන් බැහැරව මෘදුකාංග සේවා සැපයුම් සමාගමක් තෝරාගෙන ලොතරැයි මෙහෙයුම් හා කළමනාකරණ මෘදුකාංග සේවා ලබාගැනීම නිසා 2020 වර්ෂයේ සිට 2023 වර්ෂයේ අවසානය දක්වා රු.73,221,351 ක් ගෙවා තිබුණි. | මණ්ඩලයට ලොතරැයි කළමනාකරණ මෘදුකාංග පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා 2019 වර්ෂයේදී සිදු කල ප්‍රසම්පාදනයට අදාල විෂය පථය සංශෝධනය කොට නැවත ලංසු කැඳවීමට 2020 වර්ෂයේදී අධ්‍යක්ෂක මණ්ඩලය තීරණය කර තිබුණි. ඒ අනුව මෙම ආයතනයට , සම්පූර්ණ වශයෙන් මණ්ඩලයට හිමිකාරීත්වය ලැබෙන පරිදි (With Source Cord) ලොතරැයි කළමනාකරණ මෘදුකාංග පද්ධතියක් නිර්මාණය කිරීම හා ඒ සඳහා තෝරාගනු ලබන සැපයුම් ආයතනය විසින් මෘදුකාංග පද්ධතිය ස්ථාපිත කිරීමෙන් පසු දෛනිකව එහි මෙහෙයුම් ක්‍රියාවලිය ඉටු කිරීම මණ්ඩලයේ කාර්යය මණ්ඩලය සමඟ ඒකාබද්ධව සිදු කිරීම මෙම විෂය පථයට ඇතුලත් විය. ඒ අනුව එම මෘදුකාංග පද්ධතිය පිළිබඳව මණ්ඩලයේ කාර්යය මණ්ඩලය, සේවා ආයතනයේ නිලධාරීන් සමඟ එක්ව කටයුතු කිරීමේදී එහි සියළුම ක්‍රියාවලීන් පිළිබඳව මණ්ඩලයේ කාර්යය මණ්ඩලයට අවබෝධයක් ලැබෙන බැවින් එලෙස විෂය පථයට නිශ්චය කර තිබුණි.<br><br>කෙසේ වෙතත් ලොතරැයි කළමනාකරණ මෘදුකාංග පද්ධතිය ස්ථාපිත කිරීම හා මෙහෙයුම් කටයුතු සඳහා භාවිත කිරීම ඊට ගැලපෙන සුදුසුකම්ලත් තොරතුරු තාක්ෂණ වෘත්තීයවේදීන්ගෙන් සමන්විත සිදුකල යුතු කාර්යයක් බැවින් ඉහත විස්තර දක්වා ඇති පරිදි මීට අදාලව ඉදිරි කටයුතු සිදු කිරීමට බලාපොරොත්තුවන බව ද දන්වා සිටිමි. | ලොතරැයි කළමනාකරණ මෘදුකාංග පද්ධතියක් නිර්මාණය කර ස්ථාපනය කර කාර්ය මණ්ඩලය පුහුණු කිරීම සඳහා සැපයුම්කරුවකු තෝරාගැනීමේ ක්‍රියාවලිය වසර 03 කට අධික කාලයක් ගත වුවද අවසන්ව නොමැති බැවින් එය කඩිනමින් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | සංවර්ධන ලොතරැයි මණ්ඩලය සහ මෘදුකාංග සේවා සැපයුම් සමාගම අතර 2009 අගෝස්තු 18 දින ඇතිකරගත් ගිවිසුම ප්‍රකාරව මෘදුකාංග සේවා සැපයුම් සමාගම ලබාදෙන සේවාවන් සම්බන්ධ පද්ධති විගණනයක් සිදුකිරීමට මණ්ඩලයට බලය ලැබී තිබුණද මණ්ඩලය විසින් ඒ සම්බන්ධව කටයුතු කර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් ඉදිරියේදී කටයුතු කිරිමට අදහස් කර ඇත. දැනට LMS මඟින් ලබාගෙන ක්‍රියාත්මක වන තොරතුරු තාක්ෂණ පද්ධතිය වෙනුවට නව තොරතුරු තාක්ෂණ පද්ධතියක් ලබාගැනීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුලින් තෝරා ගැනීමට මූලික කටයුතු මේ වන විටත් සිදු කර ඇති බැවින් හා තොරතුරු තාක්ෂණ පද්ධතිය විගණනය සඳහා දැරීමට සිදු වන විශාල පිරිවැය පිළිබඳ සලකා බලා ඉදිරියේදී මේ පිළිබඳව තීරණ ගැනීමට යෝජිතය. | මෘදුකාංග සේවා සැපයුම් සමාගම සමඟ ඇති කරගත් ගිවිසුම ප්‍රකාරව කළ යුතුය. |
| (ඊ) | රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරණ මෙහෙයුම් කාර්ය සංග්‍රහය අනුව රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව අනුමත කරන ලද දිරිදීමනා ගෙවීමේ පටිපාටියකින් තොරව සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂය තුලදී එකතුව රු.105,739,646 ක මුදලක් දිරි දීමනා ලෙස කාර්ය මණ්ඩලයට ගෙවා තිබුණි. | මණ්ඩලය විසින් දිරිදීමනාව ගෙවීමේ ක්‍රමවේදය ඇතුලත් නව ක්‍රමවේදයක් සකස් කර 2024 මැයි 20 වන දින පැවති 294 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කරන ලද අතර ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය හිමි වූ අතර ඉදිරියේදී ඒ සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ඇත. | දිරි දීමනා ගෙවීම සඳහා නිසි කාර්ය පටිපාටියක් සකස් කර රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබාගැනීම කළ යුතුය. |
| (උ) | ඒ ඒ කාර්ය මණ්ඩල සාමාජිකයාගේ රාජකාරී ස්වභාවය, පළපුරුද්ද සහ කාර්ය සාධනය වැනි සාධක පිළිබඳ ඇගයීම සඳහා අවශ්‍ය නිර්ණායක ඇතුලත් කර දිරිදීමනා ගෙවීමේ ක්‍රමවේදයක් සකස්කිරීම සුදුසු වුවද මාසයකට රජයේ වැඩකරන දින 18 ක් රාජකාරී කල යුතුවීම යන නිර්ණායකය මත පමණක් පදනම්ව කාර්ය මණ්ඩලයට දිරිදීමනා ගෙවීම් කර තිබුණි. | 2024 මැයි 20 වන දින පැවති 294 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම සඳහා දිරිදීමනාව ගෙවීමේ ක්‍රමවේදය සම්බන්ධව සකස් කල අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කර ඇති අතර ඉදිරියේදී ඒ අනුව කටයුතු කිරීම සිදු කරනු ලැබේ. | කාර්යය මණ්ඩල සාමාජිකයන් ගේ කාර්යය සාධනය ඇගයීමට අවශ්‍ය නිර්ණායක ඇතුලත් කර දිරි දීමනා ක්‍රමයක් ස්ථාපිත කළ යුතුය. |
| (ඌ) | වාලම්පුරි විශේෂ ලොතරැයියේ දිනුම්වාර අංක 02 සිට දිනුම්වාර අංක 05 දක්වා දිනුම් වාර 04 ක් සමාලෝචිත වර්ෂය තුලදී පවත්වා ඇති අතර එම දිනුම් වාරයන්ට අදාලව බෙදාහැරීමේ අලෙවි නියෝජිතයින් වෙත නිකුත් කරන ලද ලොතරැයිපත් වලින් ආපසු එවුම් ප්‍රතිශතය නිකුත්කර තිබූ මුළු ලොතරැයිපත් ප්‍රමාණයෙන් පිළිවෙලින් සියයට 27,21, 23 හා 45 ක් වූ අතර එය | මෙම කාලච්ඡේදයේ රජයේ නව බදු ප්‍රතිපත්තියට විරුද්ධව රට පුරා රාජ්‍ය හා පෞද්ගලික අංශ වල සේවක උද්සෝෂණ හා වැඩවර්ජන වල නිරත වීම හේතුවෙන් ලොතරැයිපත් වල අලෙවියේ පසුබෑමක් ඇති විය. තවද, ජූලි මාසයේ ආරම්භයේදී දිවයින පුරා පැවති වර්ෂා තත්වය ද ලොතරැයි අලෙවිය අඩාල වීමට බලපෑම් ඇති කර ඇත. වාලම්පුරි ලොතරැයියේ 2 දිනුම් ඇදිමේ සිට 05 දිනුම් ඇදීම දක්වා අලෙවියේ ක්‍රමිකව | වාලම්පුරි විශේෂ ලොතරැයියේ අලෙවිය වැඩිකිරීමට උපක්‍රම සංවර්ධනය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ආපසු එවුම් සඳහා ඉඩදී ඇති ප්‍රතිශතයවූ සියයට 10 ට වඩා ඉතා ඉහළ අගයක් වූ අතර මෙම ආපසු එවන ලද ලොතරැයිපත් සඳහා වූ මුද්‍රණ පිරිවැය රු.2,874,111 ක් විය. | පහළ යාම සඳහා ඉහත දක්වා ඇති කරුණු බලපා ඇත.එම නිසා ආපසු එවුම් ප්‍රමාණ ප්‍රතිශතය ඉහළ ගොස් ඇත. | |
| (එ) | 2020 වර්ෂයේදී අස්ථානගතවී ඇති බවට සලකා තිබූ ක්ෂණික ලොතරැයි ටිකට් පොත් 2945 ක් වෙනුවෙන් මණ්ඩලයට ලැබිය යුතු රු.2,673,875 ක මුදල අයකර නොගැනීම සම්බන්ධව සමාලෝචිත වර්ෂයේදී මූලික විමර්ශනයක් පවත්වා තිබූ අතර ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ, XLVIII වැනි පරිච්ඡේදයේ 13.2 වගන්තිය අනුව මූලික විමර්ශනයක් පවත්වා මාස දෙකක් තුල අවසන්කළ යුතුවන අතර අමතර කාලය අවශ්‍ය වන්නේනම් ප්‍රමාණවත් පිළිගත හැකි හේතු ඉදිරිපත්කර කාලය දීර්ඝ කරගත යුතු වුවද මූලික විමර්ශය අවසන් කිරීමට මාස 30 කට අධික කාලයක් ගෙන තිබූ අතර කාල ප්‍රමාදය සඳහා විමර්ශන නිලධාරියා විසින් ප්‍රමාණවත් පිළිගත හැකි හේතු ඉදිරිපත්කර කාලය දීර්ඝ කරගැනීමක්ද සිදුකරගෙන නොතිබුණි. එසේම නිශ්චිත ක්‍රමවේදයක් නොමැතිව එම විමර්ශන නිලධාරියා තෝරාගෙන තිබූ අතර 2014 මැයි 30 දිනැති අංක 14/2014 දරණ මූලික විමර්ශන සඳහා ගෙවීම් කිරීමට අදාළ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ ප්‍රතිපාදන අනුව ගෙවීම් කලයුතු වුවද 2018 ජූලි 31 දිනැති අංක 18/2018 දරණ විනය පරීක්ෂණ සඳහා ගෙවීම් කිරීමට අදාල රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපරිම රේටයන් සාවද්‍ය ලෙස යොදාගනිමින් එකතුව රු.683,971 ක් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි.<br><br>අස්ථානගත වී ඇති බවට සැලකිය හැකි ටිකට් පොත් 2945 න් ටිකට් පොත් 2471 ක් යම් පාර්ශවයක් ඉල්ලුම් කල බවට හෝ යම් පාර්ශවයකට නිකුත් කල බවට හෝ භාරදුන් බවට හෝ ලිඛිත සාක්ෂි සංවර්ධන ලොතරැයි මණ්ඩලය සතුව නොතිබීම නිසා ක්ෂණික ලොතරැයි | මෙම මූලික විමර්ශනය සිදුකරන ලෙස 2021 ජනවාරි 06 දින ලිඛිත දැනුම්දීමක් විමර්ශන නිලධාරීන් වෙත සිදු කිරීමෙන් පසුව සමස්ථ ලෝකයට මෙන්ම ශ්‍රී ලංකාවටද බලපෑ කොරෝනා උවදුර පැවතීම නිසා විමර්ශන කටයුතු විධිමත් පරිදි ආරම්භ කිරීම සිදු කරන ලද්දේ 2022 වර්ෂයේ අගභාගය තුලදීය. එබැවින් වසර 02 කට ආසන්න කාලයක් විමර්ශන කටයුත්තක් සිදු නොවන ලදී. ඉන් අනතුරුවද මෙම විමර්ශනයට අදාළ තොරතුරු සොයා ගැනීමේ ප්‍රායෝගික ගැටලු පැවතීම නිසා යම් ප්‍රමාදයක් සිදුවිය<br><br>අස්ථානගත වී ඇති ක්ෂණික ලොතරැයි ටිකට් පොත් 2945 න් ටිකට් පොත් 2471 ක් යම් පාර්ශවයක් ඉල්ලුම කල බවට හෝ යම් පාර්ශවයකට නිකුත් කල බවට හෝ භාර ගත් බවට සඳහන් කිසිදු ලියවිල්ලක් සොයාගැනීමට නොහැකි වී ඇත. එමෙන්ම දැනට අය විය යුතු යැයි හඳුනා ගෙන ඇති පාර්ශවයන්ගෙන් මෙම මුදල් අය කර ගැනීම සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර ඇති බැවින් අස්ථානගත වී ඇති ලොතරැයි ටිකට්පොත් වලින් සැලකිය යුතු මුදලක් අය කර ගැනීමට හැකියාව ලැබෙනු ඇත. | ලැබිය යුතු මුදල් අයකර ගැනීමට අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ටිකට් පොත් සඳහා අයවිය යුතු මුදලින් සියයට 83 ක් වූ රු.2,191,785 ක මුදල අයකර ගැනීමට නොහැකිවී තිබුණි. | | |
| (ඒ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 01 දින සිට දෙසැම්බර් 10 දින දක්වා දිනුම් අදින ලද කප්රුක ලොතරැයිපත් මුද්‍රණය කිරීමේදී එහි සුපිරි ජයමල්ල වූ රු.මිලියන 470 ක මුදල ලොතරැයිපතේ මුහුණත දකුණුපස ඉහල කෙලවරේ චිත්‍ර සටහනේ "සිහින ජයමල්ල රු.ලක්ෂ 47000 ක් " ලෙස දෝෂ සහිතව මුද්‍රණය කර තිබූ අතර කෙටුම්පත් කලා ආකෘති (Art Work) සහ මුද්‍රිත ලොතරැයිපත් නියැදි පරීක්ෂා කිරීම සඳහා මණ්ඩලය විසින් ස්ථාපනය කර තිබූ අභ්‍යන්තර පාලන ක්‍රමවේදයේ පැවති දුර්වලතාවයන් සහ මුද්‍රණ දෝෂ හඳුනාගැනීම සඳහා පත්කර තිබූ අලෙවිකරණ අංශයේ නිලධාරීන් සහ තත්ව පරීක්ෂණ මණ්ඩලයේ නිලධාරීන් විසින් මෙම දෝෂයන් හඳුනාගැනීමට අපොහොසත් වීම යන කරුණු නිසා මුද්‍රණ දෝෂ සහිත ලොතරැයිපත් 4,392,010 ක් වෙළඳපොලට නිකුත්කර තිබුණි. තවද මෙම මුද්‍රණ දෝෂය සහ එය නිවැරදි විය යුතු ආකාරය පිළිබඳව පාරිභෝගිකයා දැනුවත් කිරීම සඳහා පුවත්පත් දැන්වීම් පලකිරීම වෙනුවෙන් රු.22,873 ක මුදලක් මණ්ඩලයට දැරීමට සිදුවී තිබුණි. | මේ සඳහා 2023 දෙසැම්බර් 06 දින පුවත්පත් දැන්වීම් කිහිපයක් මගින් පාරිභෝගික ජනතාව වෙත දැනුවත් කිරීම තුලින් නිවැරදි කිරීමක් සිදු කරන ලදී.ඉදිරියේදි මෙවැනි අතපසුවීම මගහරවා ගැනීමට අභ්‍යන්තර පාලන ක්‍රමය ශක්තිමත් කර ඇත. | මුද්‍රණ දෝෂ සහිත ලොතරැයි ටිකට්පත් වෙළඳපලට නිකුත් කිරීමට පෙර ඒවා හඳුනාගැනීමට පත්කල නිලධාරීන් විසින් නිසිලෙස රාජකාරී ඉටුනොකිරීම සම්බන්ධව විනයානුකූලව කටයුතු කළ යුතුය. |
| (ඔ) | සුපිරි ධන සම්පත ලොතරැයිය දිනුම් ඇදීමේ කටයුතු පරිගණක මෘදුකාංගයක් භාවිතා කරමින් ජාතික රූපවාහිනී පරිශ්‍රයේ චිත්‍රාගාරයෙන් පිටත ඇති කාමරයක් තුලදී සිදුකරනු ලබන අතර රූපවාහිනිය මගින් විකාශනය කිරීමේදී දිනුම් අදින ලද සත්‍ය ආකාරය නොපෙන්වා වීඩියෝ සජීවිකරණ මෘදුකාංගයක් (Game Animation Software) උපයෝගී කරගෙන දිනුම් ඇදීමේ යන්ත්‍රයක් මගින් පන්දු මිශ්‍රකර ඉන් අහඹු ලෙස පන්දුවක් තෝරාගැනීම සිදුකරන ආකාරයට වීඩියෝවක් නිර්මාණය කර විකාශනය කරනු ලැබේ. මෙම වීඩියෝ සජීවිකරණ මෘදුකාංගය නිර්මාණය කරගැනීම සඳහා තෝරාගත් | සුපිරි ධන සම්පත ලොතරැයිපත් දිනුම් ඇදීමේ ක්‍රියාවලිය සඳහා නව යන්ත්‍රයක් මිලදී ගැනීමට මාස 06ක පමණ කාලයක් ගතවන බැවින් හා 2023 වර්ෂය තුලදී අපේක්ෂිත ආදායම් උත්පාදනය කරගැනීම අරමුණු කරගෙන ඩිජිටල් තාක්ෂණය ඔස්සේ දිනුම් අංක තේරීම කෙරෙහි අවධානය යොමු කරන ලදී. එහිදී නිර්මාණිත මෘදුකාංග 03ක් ඔස්සේ සම්පූර්ණ දිනුම් ඇදීමේ ක්‍රියාවලිය සිදුවන අතර එහි දිනුම් අංක ජනනය වෙනුවෙන් වන මෘදුකාංගය පූර්ණ විගණනයක් සහිතව පිළියෙල කර ඇත. තවද මෙහිදී දිනුම් ඇදීමේ යන්ත්‍රයෙහි සත්‍ය ස්වරූපයට සමාන වීඩියෝ ඇනිමේෂන් එකක් මගින් පාරිභෝගිකයා හට දිනුම් ඇදීමේ යන්ත්‍රයක ස්රවරූපයට සමාන | පාරිභෝගික විශ්වාසය ඇති වන පරිදි දිනුම් අදින ලද සත්‍ය ආකාරය රූපවාහිනිය මඟින් විකාශනය කිරීම. |

| | | | |
|---|---|---|---|
| | පුද්ගලික ආයතනයට මණ්ඩලය විසින් රු.3,350,000 ක මුදලක් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබූ අතර 2024 වර්ෂයේ සිට සේවා සැපයීම වෙනුවෙන් දෛනිකව රු.5,000 බැගින් වාර්ෂිකව රු.1,860,000 ක් ගෙවීමට ගිවිසුම් ගතව තිබුණි. මෙම ලොතරැයියේ දිනුම් ඇදීමේ ක්‍රියාවලිය 2024 මැයි 02 දින සිට දිනුම් ඇදීමේ යන්ත්‍රයක් ඇසුරින් සිදුකරනු ලැබේ. | ප්‍රතිරූපයක් ලබාදී ඇති අතර එමඟින් පාරිභෝගික ආකර්ශනය පවත්වා ගැනීමට කටයුතු කර ඇත. මෙලෙස සිදු කර ඇත්තේ නව යන්ත්‍රය මිල දී ගැනීමෙන් පසුවද ලොතරැයි දිනුම් ඇදීමේ ක්‍රියාවලිය වෙනස් නොවන පරිදි එකම ස්වරූපයෙන් පවත්වා ගැනීමට හැකියාව ලැබෙන නිසාවෙනි. එසේ නොමැතිව ලොතරැයි ටිකට්පත හඳුන්වා දුන් ආරම්භක අවස්ථාවේ එක් ක්‍රමයකටත්, දිනුම් ඇදිමේ යන්ත්‍රයක් මිලදි ගැනිමෙන් පසුව තවත් ක්‍රමයකටත් ලොතරැයි දිනුම් ඇදීමේ ක්‍රියාවලිය සිදු වුවහොත් එමඟින් පාරිභෝගික විශ්වාසයට බලපෑමක් එල්ල විය හැකිබව නිරීක්ෂණය වූ බැවිනි. | |
| (ඕ) | සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් 2020 වර්ෂයේ වෙළඳපොලට හඳුන්වාදුන් සසිරි ලොතරැයියේ දිනුම් ඇදීමේ කටයුතු ජාතික රූපවාහිනී පරිශ්‍රයේ චිත්‍රාගාරයෙන් පිටත ඇති කාමරයක් තුළදී සිදුකරනු ලබන අතර රූපවාහිනිය මඟින් විකාශනය කිරීමේදී දිනුම් අදින ලද සත්‍ය ආකාරය නොපෙන්වා වීඩියෝ සජීවිකරණ මෘදුකාංගයක් උපයෝගී කරගෙන වීඩියෝවක් නිර්මාණය කර විකාශනය කරනු ලැබේ. තවද මෙම දිනුම් ඇදීමේ ක්‍රියාවලිය සඳහා භාවිතා කරන මෘදුකාංග පද්ධතිය සම්බන්ධව 2021 වර්ෂයේදී පුද්ගලික විගණන ආයතනයක් විසින් පද්ධති විගණයක් සිදුකර හඳුනාගන්නා ලද පද්ධති දෝෂ 04 ක්, පද්ධති සීමා දෝෂ 04 ක්, ව්‍යුහාත්මක දුර්වලතා දෝෂ 03 ක්, පරිශීලක අතුරු මුහුනත් දෝෂ 03 ක් සහ පාලන ඌනතා දෝෂ 01ක් වශයෙන් විවිධ දෝෂ වර්ග 15 ක් සමාලෝචිත වර්ෂය අවසන්වන විටත් නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි. | දෛනිකව ලොතරැයි පැවැත්වීම වෙනුවෙන් අවශ්‍ය නොවන මෙන්ම මේවනවිට පද්ධතියේ භාවිතා කරනු නොලබන අයිතමයන්ට අදාලව සහ පද්ධතිය පුළුල් කිරීමක් සිදු කිරීමේදී බලපානු ලබන සීමාවන් සම්බන්ධයෙන් මෙහි සඳහන් දෝෂයන් පවතී. එම දෝෂයන් නිවැරදි කිරිම හා පද්ධතිය පුළුල් කිරීම දෙවන අදියරේදී සම්පූර්ණ කිරීමට බලාපොරොත්තුවේ. | හඳුනාගත් විවිධ දෝෂ වර්ග 15 කඩිනමින් නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වීම සහ පාරිභෝගික විශ්වාසය ඇති වන පරිදි දිනුම් අදින ලද සත්‍ය ආකාරය රූපවාහිනිය මඟින් විකාශනය කිරීම. |
| (ක) | සුපිරි ධන සම්පත ලොතරැයියේ 49 වන දිනුම් වාරය | | |
| | (i) සුපිරි ධන සම්පත ලොතරැයිය දිනුම් ඇදීමේ ක්‍රියාවලියේ පැවති තාක්ෂණික හා පාලන දුර්වලතාවයන් නිසා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 27 දින දිනුම් අදින ලද සුපිරි ධන සම්පත හි 49 | සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ලොතරැයි දිනුම් ඇදීමේ ක්‍රියාවලියේ සිදුවූ යම් අතපසුවීමක් මත නිවැරදි අංකය වෙනුවට වැරදි අංකයක් නිල ප්‍රතිඵලය ලෙස ප්‍රකාශයට පත්විය. මෙම ප්‍රතිඵලය මත පදනම්ව දිනුම් ඇදීමට අදාළ ජයග්‍රාහකයින් | පාරිභෝගික විශ්වාසය කඩ නොවන ලෙස අභ්‍යන්තර පාලන ක්‍රමවේදය |

| | | | |
|---|---|---|---|
| | වන දිනුම් වාරයේදී දිනුම් ඇදීමේ මෘදුකාංගය මගින් ලබාදුන් ජයග්‍රාහී අංක 06 හා ඉංග්‍රීසි අක්ෂරය වෙනුවට වැරදි අංකයක් සහිතව නිල ප්‍රතිඵල නිකුත් කර එම වැරදි අංකය පදනම් කරගෙන ජයග්‍රාහකයන් සඳහා මුදල් ගෙවීම් කර තිබුණි. | දිනුම් අදින ලද දිනට පසුදින සිට සිය ජයග්‍රාහී ත්‍යාග මුදල් ලබාගැනීමට ඉදිරිපත් වේ. සුපුරුදු පිළිවෙත මත දෛනික දිනුම් ඇදීමේදී LMS පද්ධතියට ඇතුළත් කරනු ලබන ජයග්‍රාහී තොරතුරු ඇතුලත් ගොනුවට අදාලව ගෙවීම සිදුකර ඇත. කෙසේ වෙතත් අදාළ ගැටලුව නිරීක්ෂණය වීමෙන් අනතුරුව මේ සම්බන්ධයෙන් යොමු කළ 2024 ජනවාරි මස 05 දින පැවති 289 වන අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාවට අනුව ඒ වන විටත් ගෙවීම් සිදු කරනු ලැබූ ජයග්‍රාහී දත්ත ගොනුවට තව දුරටත් ගෙවීම් සිදු කිරීම කාලෝචිත බව නිරීක්ෂණය විය. එසේ සිදුකරන ලද්දේ යම්හෙයකින් ප්‍රසිද්ධ වූ නිල ප්‍රතිඵලය නිවැරදි නොවන බවට ප්‍රකාශ වුවහොත් පාරිභෝගික විශ්වාසය කඩවන අතර, එමගින් ලොතරැයි ක්ෂේත්‍රයට විශාල බලපෑමක් විය හැකි බැවිනි.<br><br>මෙවැනි ආකාරයේ සිදුවීමක් ප්‍රථම වතාවට සිදු වී තිබීම හේතුවෙන් ගත යුතු පියවර පිළිබඳ ක්‍රමවේදයක් හඳුන්වා දී නොතිබුණි. එම නිසා අවශ්‍ය උපදෙස් ලබා ගැනීම සඳහා 2024 ජනවාරි මස 05 දින වහාම අධ්‍යක්ෂ මණ්ඩලය රැස් වී අවශ්‍ය තීන්දු, තීරණ හා අවශ්‍ය පියවරයන් ගනු ලැබීය.<br>කෙසේවෙතත් තවදුරටත් මෙවැනි ගැටලු ඉදිරියට සිදුනොවීමට අභ්‍යන්තර පාලන ක්‍රමවේද තවදුරටත් ශක්තිමත් කර ඇත. තවද මේ වෙනුවෙන් අවශ්‍ය මානව සම්පත් පුහුණුව ද ලබා දීමට කටයුතු කර ඇත. | ශක්තිමත් කළ යුතු වීම සහ වැරදි අංකයක් සහිතව නිල ප්‍රතිඵල නිකුත් කිරීමට කටයුතු කළ නිලධාරීන්ගෙන් මණ්ඩලයට සිදුවූ අලාභය අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ii) | සුපිරි ධන සම්පත 49 වන දිනුම් වාරයේදී දිනුම් ඇදීමේ මෘදුකාංගය මගින් ලබාදුන් නිවැරදි ජයග්‍රාහී අංක 06 හා ඉංග්‍රීසි අක්ෂරය සඳහාද ගෙවීම් කිරීමට 2024 ජනවාරි 05 දින පැවති 289 වන අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීමේදී තීරණය කර ඒ බව 2024 ජනවාරි 10 දින පුවත්පත් දැන්වීමක් මගින් ප්‍රසිද්ධ කර තිබුණද 2024 අප්‍රේල් 24 දින දක්වාත් එම ගෙවීම් කිරීමට හැකිවන ලෙස මණ්ඩලයේ පරිගණක පද්ධතිය යාවත්කාලීන කර ගෙවීම් කර නොතිබුණි. | නිවැරදි අංකයට හා ප්‍රසිද්ධ වූ අංකය යන අංක දෙකටම ගෙවීමට සිදු වූ පළමු අවස්ථාව මෙය වන බැවින් ඒ සඳහා ගෙවීම් කිරීමට යෝග්‍ය වන පරිදි පරිගණක පද්ධතියේ සිදුකළ යුතු වෙනස්කම් සිදු කිරීමට යම්කිසි සාධාරණ කාලයක් ගත වේ. එබැවින් මණ්ඩලය විසින් හිතාමතා නිවැරදි අංකයට ගෙවීම් කිරීම ප්‍රමාද කිරීම සිදු නොකළ අතර මණ්ඩලය ලොතරැයි පාරිභෝගිකයින්ට පවතින වගකීම හා වගවීම හේතුවෙන් යම් පාර්ශවයකට අසාධාරණයක් සිදු නොවන පරිදි පද්ධතිය සකස් කිරීමට කටයුතු කල බැවින් ඒ සඳහා සාධාරණ කාලයක් ගතවිය. වර්තමානය වනවිට පද්ධතිය යාවත්කාලීන කිරීම සිදුකර ඇති බැවින් අදාළ ගෙවීම් සිදු කිරීමට මෙන් ම ත්‍යාග මුදල් ලබාගැනීමට ද හැකියාව ඇත. | පරිගණක පද්ධතිය නිසි වේලාවට යාවත්කාලීන කළ යුතු වීම සහ පාරිභෝගික විශ්වාසය ඇති වන ලෙස කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (iii) | සුපිරි ධන වාසනා ලොතරැයිපතේ 49 වන දිනුම් වාරයේදී දිනුම් ඇදීමේ මෘදුකාංගය මගින් ලබාදුන් නිවැරදි ජයග්‍රාහී අංක 06 ම පිළිවෙලට ගැලපෙන රු.2,500,000 ක මුදලක් ජයග්‍රහණය කර ඇති ලොතරැයි පතක් අලෙවි කර තිබුණද දිනුම් ඇදීමේ ක්‍රියාවලියේදී සිදුවූ මෙම දෝෂය නිවැරදි කිරීමට මණ්ඩලය අපොහොසත් වීම නිසා එම ලොතරැයිපත මිලදීගත් පාරිභෝගිකයාට රු.2,000 ක මුදලක් පමණක් ලබාගැනීමට සිදුවී තිබුණි. | සුපිරි ධන සම්පත 49 වන දිනුම් වාරයේ මුල් ප්‍රතිඵල ලේඛණය නිකුත් වූ පසු සහ නිවැරදි අංක සහිත ප්‍රතිඵල නිකුත් කිරීමට පෙරාතුව ඉහත කී රු.2,000 කට හිමිකම් ලබාගත් ටිකට් පත ත්‍යාග මුදල් ලබාගැනීම වෙනුවෙන් දිස්ත්‍රික් අලෙවි නියෝජිත දක්වා ඉදිරිපත් වී, එය මණ්ඩලයෙන් ද ප්‍රතිපූරණය කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකර තිබුණි. නිවැරදි අංක සහිත ජයග්‍රාහී දත්ත ගොනුවට අනුව එම ටිකට් පතට රු. 2,500,000 ත්‍යාග මුදලක් හිමිව තිබුණද එය දිස්ත්‍රික් අලෙවි නියෝජිත දක්වා ඉදිරිපත් වූ ටිකට් පතක් බැවින් සහ එහි සත්‍යය ජයග්‍රාහකයා සොයා ගැනීම අපහසු හෙයින් මණ්ඩලය ලොතරැයි පාරිභෝගිකයින්ට පවතින වගකීම හා වගවීම මත පදනම්ව එය තවදුරටත් රු.2,000 ගෙවීමක් ලෙස සලකා කටයුතු කර ඇත. කෙසේවෙතත් ඉහත සඳහන් කල වගකීම සහ වගවීම යටතේ අදාළ ජයග්‍රාහකයා ඇතුළු සියළුම පාර්ශවයන්ට සාධාරණයක් කිරීම අරමුණු කරගෙන 2024 වර්ෂයේ ජනවාරි මස 10 වන දින භාෂා ත්‍රිත්වයෙන් ම පුවත්පත් මාධ්‍යයෙන් සමස්ථ ජනතාව දැනුවත් කර ඇත. | පාරිභෝගික විශ්වාසය ඇති වන ලෙස කටයුතු කළ යුතුය. |
| (ග) | විකුණුම් මිල රු.20 ක්ව පැවති 2023 ජනවාරි සිට ජූලි 05 දක්වා කාලපරිච්ඡේදයේ ලොතරැයිපත් වර්ග 07 හි E ලොතරැයි අලෙවිය ලොතරැයිපත් 453,948 ක් වූ අතර විකුණුම් මිල රු.40 ක් දක්වා වැඩිකිරීමෙන් පසු 2023 ජූලි 06 දින සිට දෙසැම්බර් 31 දින දක්වා කාලපරිච්ඡේදයේ E ලොතරැයිය අලෙවිය ලොතරැයිපත් 2953 ක් දක්වා සියයට 99.7 ක ප්‍රතිශතයකින් පහළ ගොස් තිබුණි. | මිල රු.40 වීමත් සමඟ සාමාන්‍ය ලොතරැයි දිනුම් ඇදීමට අමතරව ලග්න වරම සහ Second Chance දිනුම් ඇදීමක් සිදු කරන ලදී. ඒ සඳහා අදාල වන පරිදි දැනට පවතින පරිගණක පද්ධතිය වෙනස් කිරීම සිදු කල යුතු විය. ඒ වෙනස් කිරීම සඳහා යම් කාලයක් ගත වන බව අදාල පරිගණක ආයතනය මගින් දැනුම් දී තිබුණි. එම නිසා 2023 ජූලි 06 සිට නවතා තිබූ Sweep App පද්ධතිය 2023 දෙසැම්බර් 25 නැවත ආරම්භ කරන ලදී.<br><br>පරිගණක පද්ධතිය සංවර්ධන කටයුතු සඳහා 2023 ජූලි 06 සිට 2023 දෙසැම්බර් 25 දක්වා Sweep App හරහා සිදු කල අලෙවි මෙහෙයුම් කටයුතු නවතා තිබූ බැවින් අලෙවිය පහත ගොස් ඇති බව වාර්තා කරමි. | E ලොතරැයිපත් අලෙවිය ප්‍රවර්ධනය සඳහා ක්‍රමවත් වැඩපිළිවෙලක් යෙදිය යුතුය. |
| (ච) | ලොතරැයි මිල රු.40 දක්වා වැඩිකිරීමෙන් පසු ශනිදා වාසනා, ලග්න වාසනා, කප්රුක, සුපර්බෝල්, අද කෝටිපති, සසිරි සහ ජයෝදා යන ලොතරැයි පත් 07 හි E ලොතරැයි අලෙවි | Sweep App අලෙවි කටයුතු අක්‍රියව පැවතියේ පරිගණක පද්ධතියේ සංවර්ධන කටයුතු නිසා බව වාර්තා කරමි. | පරිගණක පද්ධතිය සංවර්ධන කටයුතු කඩිනමින් |

| | | |
|---|---|---|
| අලෙවිය නවතා තිබූ අතර 2023 දෙසැම්බර් මස ලොතරැයි 06 ක E ලොතරැයි අලෙවිය නැවත ආරම්භ කර තිබුණද කප්රුක E ලොතරැයි අලෙවිය සම්පූර්ණයෙන්ම නවතා තිබුණි. | | නිමකර E ලොතරැයිපත් අලෙවිය නැවත ආරම්භ කළ යුතුය. |

**3.2 ප්‍රසම්පාදන කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය මත සංවර්ධන ලොතරැයි මණ්ඩලය සඳහා ව්‍යාවසාය සම්පත් සැලසුම්කරණ (ERP) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට 2019 වර්ෂයේ සැලසුම්කර තිබුණි. මෙම ව්‍යාපෘතියේ පළමු අදියර ලෙස ගිණුම්කරණ මෘදුකාංග පද්ධතියක් ස්ථාපිත කිරීමේ කාර්යය 2020 වර්ෂයේ සිට සෑම වර්ෂයකම ප්‍රසම්පාදන සැලැස්මට ඇතුලත් කර තිබුණද එම ප්‍රසම්පාදන කටයුතු සමාලෝචිත වර්ෂයේ අවසානය තෙක් ආරම්භ කර නොතිබුණි. | මෙම ඡේදයේ දක්වා ඇති පරිදි ආයතනය සඳහා ERP පද්ධතියක් ස්ථාපිත කිරීමට සැලසුම් කර තිබුණි. ඒ අනුව මණ්ඩලයේ සමස්ථ මෙහෙයුම් ක්‍රියාවලියට අදාල අවශ්‍යතාවය නිශ්චය කොට එක් එක් අංශ මට්ටමින් ඉටු කෙරෙන ක්‍රියාවලිය අධ්‍යනය කොට එහි විෂය පථය ඇතුලත් වාර්තාවක්ද පිළියෙල කර ඇත. පසුව මෙම ව්‍යාපෘතියේ පළමු අදියර ලෙස ගිණුම්කරණ මෘදුකාංග පද්ධතියක් ස්ථාපිත කිරීමට තීරණය කර තිබූ අතර එම කාර්යය 2023 වර්ෂයේදී ආතර් සී. ක්ලාක් මධ්‍යස්ථානය වෙත භාර දී තිබුණි. එහෙත් එම ආයතනය පසුව එම කාර්යය ඉටුකිරීම ප්‍රතික්ෂේප කර ඇති බැවින් මේ සඳහා නැවතත් තරඟකාරී ලංසු මිල ගණන් කැඳවා සුදුසු සැපයුම්කරුවෙකු තෝරා ගැනීමට කළමනාකාරීත්වය තීරණය කර ඇත. | ප්‍රසම්පාදන සැලැස්මට අනුව කටයුතු කළ යුතුය. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**අයවැය පාලනය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දැනට ලෝකයේ පවත්නා තාක්ෂණික නැඹුරුව හා ලොතරැයි වෙළඳපොලේ පවත්නා තරඟකාරිත්වය සැලකිල්ලට ගෙන ලොතරැයි අලෙවිය ඩිජිටල් මාධ්‍ය භාවිතාකර සිදුකිරීම සඳහා ඩිජිටල් යෙදවුමක් DLB Sweep නමින් ආරම්භ කර SMS මාධ්‍ය හරහා E ලොතරැයි අලෙවි කිරීම, අලෙවි ප්‍රවර්ධනය ඇතුළු කාර්යයන් සඳහා 2023 වර්ෂයේ අයවැය මඟින් රු.57,625,000 ක මුදලක් උපයෝජනය කිරීමට සැලසුම් කර තිබුණද 2023 වර්ෂයේ E ලොතරැයි අලෙවි ප්‍රවර්ධන කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණේ රු.1,643,873 ක මුදලක් පමණක් වූ අතර එය ඇස්තමේන්තුගත | ශ්‍රී ලංකා මහ බැංකුවේ උපදෙස් මත මෙම යෙදවුම නිර්මාණය වූ බැවින් මෙම යෙදවුමට ඇතුළත් වීමේ යම් යම් ප්‍රායෝගික අපහසුතාවලට පාරිභෝගිකයාට මුහුණ දීමට සිදු වීම හේතුවෙන් මෙම යෙදවුම හරහා අලෙවිය සිදු කිරීමේ ගැටලු පැවතුණි. ඒ අනුව මෙම යෙදවුම ප්‍රවර්ධනය කිරීම සඳහා එම බාධක නිවැරදි කර පසුව ප්‍රවර්ධන කටයුතු සිදු කරන ලෙස 2022 සැප්තැම්බර් 28 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදි උපදෙස් ලබා දී ඇත. ඒ බැවින් ප්‍රවර්ධන කටයුතු සඳහා වෙන් කර තිබූ වෙන් කිරීම් | E ලොතරැයිපත්හි ප්‍රවර්ධන කාර්යයන් ක්‍රියාත්මක කර ලොතරැයිපත් අලෙවිය වර්ධනය කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | මුදලින් සියයට 3 ක් පමණ වැනි ඉතා පහළ ප්‍රතිශතයක් විය. | සම්පූර්ණයෙන් භාවිතා කිරීමට නොහැකි විය. | |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ සංශෝධිත අයවැය ලේඛනය අනුව රු.27,086,530,651 ක ඉලක්ක ගත ලොතරැයි විකුණුම් ආදායමක් උපයා ගැනීමට පුරෝකථනය කර තිබුණද උපයාගත් තථ්‍ය ආදායම රු.26,608,397,380 ක් වීමෙන් අයවැය ගත ආදායමට වඩා රු.478,133,271 ක් අඩුවෙන් ආදායම් උපයා තිබුණි. | • සංශෝධිත අයවැය මඟින් සුපිරි ධන සම්පත ලොතරැයිපත 2023 ඔක්තෝම්බර් මස වෙළඳපලට නිකුත් කිරීමට නියමිතව තිබුණ ද එහි පැවැති තාක්ෂණික පද්ධතිය නිර්මාණය කිරීමට යම් කාලයක් ගත වූ හෙයින් එම ලොතරැයිපත වෙළඳපලට නිකුත් කරන ලද්දේ 2023 නොවැම්බර් මසය. එමඟින් එම ලොතරැයින් ලැබෙන්නට නියමිත වූ ආදායම අඩු විය.<br><br>• සංශෝධිත අයවැය මඟින් වාලම්පුරි දිනුම් ඇදීම 02ක් නියමිතව තිබුණද මිල රු.40 වීමත් සමඟ වාලම්පුරි ලොතරැයිය සඳහා ඉල්ලීම අඩු වීම හේතුවෙන් එම දිනුම් ඇදීම් 02 සිදු නොකිරීම හේතුවෙන් එම විකුණුම් ආදායම මණ්ඩලයට අහිමි විය.<br><br>මිල රු.40 වීමත් සමඟ ක්ෂණික ලොතරැයිවල අපේක්ෂිත ආදායමට ලඟා වීමට නොහැකි විය. | ඉලක්කගත විකුණුම් ආදායම උපයා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ වියදම් අයිතම 17ක සංශෝධිත අයවැය ප්‍රතිපාදන සීමාව ඉක්මවා එකතු වටිනාකම රු.28,812,660 ක වියදම් සිදුකර තිබුණි .එම එක් එක් අයිතම සලකා බැලීමේදී අයවැය ප්‍රතිපාදන සීමාව ඉක්මවා වියදම් කිරීම සියයට 2ත් සියයට 1503ත් අතර පරාසයක පැවතුණි. | මෙම වැය ශීර්ෂ 17 පරිපාලන වියදම් කාණ්ඩයට අදාල වැය ශීර්ෂයන් වන අතර සමාලෝචිත වර්ෂයේ පැවති අයහපත් ආර්ථික තත්වය තුළ අමුද්‍රව්‍ය මිල හා සේවා මිල ගණන් වල සිදුවූ නිරන්තර වෙනස්වීම් මත අයවැය ප්‍රතිපාදන නිශ්චිතව පුරෝකථනය කිරීමේ ගැටළුවක් පැවතිණ. | වියදම් දැරීමේදී අයවැයගත ප්‍රතිපාදනයන්ට අනුකූලව කටයුතු කළ යුතුය. |